සොරණාතොට ප්‍රාදේශීය සභාව
බදුල්ල දිස්ත්‍රික්කය
----------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 24 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට සොරණාතොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

(අ) <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල් රු රු.155,693 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | මුළු මුදලම ණයහිමි ලෙස වෙන්කර ඇතත් මේ දක්වා ගෙවා නොමැත. |

(ආ) <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.686,829,102 ක වත්කම් විෂයයන් 03 ක් සහ ගෙවිය යුතු තැන්පතු රු.1,475,165 ක් ඔප්පු, පිඹුරුපත්, පැවරුම් නියෝග, උපලේඛන,ස්ථාවර වත්කම් ලේඛන හා ශේෂ තහවුරු කිරීම් ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | සාක්ෂි සොයා බලා අඩුපාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරමි. |

1.4 <u>අනුකූල නොවීම්</u>

<u>නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම්</u>

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | | | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත | | | | |
| | (i) | 132 වගන්තියේ ඒ සහ ඕ උප වගන්ති | සමාලෝචිත වර්ෂය තුළ පෙර පාසැල් බෑග් ලබාගැනීම වෙනුවෙන් ගෙවා ඇති රු.341,900 ක මුදල සඳහා විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | පනතට අනුව කටයුතු කළ යුතුවේ. | අමාත්‍යවරයාගේ අනුමැතියට යවා ඇත. |
| | (ii) | 158 හා 159 වගන්ති | සමාලෝචිත වර්ෂයට අදාල අයවිය යුතු රු.637,795 ක හිඟ ආදායම් අය කරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකරගත යුතුවේ. | හිඟ ගාස්තු අය කර ගැනීම සඳහා පාරිභෝගිකයන් දනුවත් කර ඇත. |
| (ආ) | 1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | | |
| | (i) | 5(3)රීතිය | සමාලෝචිත වර්ෂයේදි ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුවේ. | අභ්‍යන්තර විගණන නිලධාරියෙකු දැනට පත්කර ඇත. |
| | (ii) | රීති 203 හා204 | 2017 හා 2018 වර්ෂවල භාණ්ඩ සමීක්ෂණ වලදි හඳුනාගෙන තිබුණු භාණ්ඩ විෂයයන් 27 කට අදාල භාණ්ඩ ඒකක 59 ක ඌනතා සම්බන්ධයෙන් අදාල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | රීති අනුව කටයුතු කළ යුතුවේ | සමීක්ෂණ මණ්ඩල නිර්දේශය ක්‍රියාත්මක කිරිමට නිලධාරින්ට උපදෙස් ලබාදි ඇත. |

2. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව,සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.1,022,489 ක් වූ අතර,ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.145,040 විය.

## 2.2 <u>ආදායම් පරිපාලනය</u>

### 2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන් තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන් තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් බදු | 87,124 | 86,592 | 55,240 | 31,352 | 87,124 | 86,593 | 61,203 | 25,390 |
| ii. | අක්කර බදු | 9,600 | 9,600 | 5,167 | 4,434 | 9,600 | 9,601 | 5,270 | 4,331 |
| iii | බලපත්‍ර ගාස්තු | 500,000 | 491,800 | 491,800 | - | 380,000 | 493,754 | 493,754 | - |
| iv. | කුලී | 388,800 | 420,165 | 396,697 | 422,849 | 468,800 | 395,412 | 358,600 | 36,811 |
| v. | ජල ගාස්තු | 1,600,000 | 1,907,150 | 1,862,870 | 44,280 | 1,300,000 | 1,854,570 | 1,839,315 | 15,255 |
| | එකතුව | 2,585,524 | 2,915,307 | 2,811,774 | 502,915 | 2,245,524 | 2,839,930 | 2,758,142 | 81,787 |

### 2.2.2 <u>ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසරකට අධික කාලයක සිට පැවත එන ලැබිය යුතු ආදායම් ණය ගැතියෝ රු.14,279,928 ක් අය කරගෙන නොතිබුණි. | අයවිය යුතු පාර්ශවයන් හඳුනාගෙන හිඟ ආදායම් අය කරගත යුතුවේ. | විමසුම නිවැරදි වේ. |

### 2.2.3 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) <u>උසාවි දඩ</u><br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති උසාවි දඩ රු.2,200,000 ක් අය කර නොතිබුණි. | හිඟ උසාවි දඩ මුදල් අයකර ගත යුතුවේ. | 2019 වර්ෂයේදි අයවීමට නියමිතව ඇත. |
| (ආ) <u>මුද්දර ගාස්තු</u><br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති මුද්දර ගාස්තු රු.1,329,850 ක් අය කර නොතිබුණි. | හිඟ මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | 2019 වර්ෂයේදි අයවීමට නියමිතව ඇත. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය,පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණද,2018 දෙසැම්බර් 31 දින වන විට කාරණා 11 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුවේ. | ඉදිරියේදි අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කරමි. |

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2012 දෙසැම්බර් 05 දිනැති අංක 1178/45 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව ප්‍රාදේශීය සභා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව සම්මත අතුරු ව්‍යවස්ථා ප්‍රාදේශිය සභාව වැළඳගෙන තිබුණද,කසල බදු අය කිරීමට අවශ්‍ය පරිශ්‍රයන් හඳුනාගෙන බදු අය කිරීමට 2018 දෙසැම්බර් 31 දින වනවිටද කටයුතු කර නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කළ යුතුවේ. | නිවැරදි කසල බඳුන් මහජනතාව වෙත ලබාදීම හා ඉදිරියේදි නිවැරදිව ඝන අපද්‍රව්‍ය කළමනාකරණයක් කිරීමට නිලධාරින්ට උපදෙස් ලබාදී ඇත. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව එක්සත් ජාතීන්ගේ " තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනා ගැනීමට |

| | | |
|---|---|---|
| දැනුවත්වී තිබුණද, සභාවට අදාල කර ගත හැකි වන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | දර්ශක හඳුනාගෙන අනුව වාර්ෂිකව ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | ඒ කටයුතු කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2016 වර්ෂයේදි දුන්හිඳ දියඇල්ල ප්‍රවේශ මාර්ගය සංවර්ධනය කිරිමේ කර්මාන්තයෙහි අතරුඳවුම් රු.68,051 ක් දෙවතාවක් ගෙවීම හේතුවෙන් රු.68,051 ක පාඩුවක් සභා අරමුදලට සිදුවි තිබුණි. | වැඩියෙන් ගෙවා ඇති අතරුඳවුම් මුදල් අයකර ගත යුතුවේ. | අදාල ග්‍රාම සංවර්ධන සමිතිය දැනුවත් කර අය කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | වසරකට අධික කාලයක සිට පැවත එන ගෙවිය යුතු ණයහිමි ශේෂ රු.15,910,328 ක් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | විමසුම නිවැරදි වේ. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 04 කට අදාලව 15 ක අතිරික්ත කාර්ය මණ්ඩලයක් විය. | කාර්ය මණ්ඩලය අනුමත කරගත යුතුවේ. | මෙම වර්ෂය තුල අතිරික්ත කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 06 කට අදාලව පැවති පුරප්පාඩු 06 ක් සම්පූර්ණ කර නොතිබුණි. | පුරප්පාඩු පිරවිය යුතුවේ. | පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | සභාවේ සේවය කර විශ්‍රාම ගිය නිලධාරයෙකුගෙන් අයවිය යුතු රු.238,307 ක ණය ශේෂය අය කරගෙන නොතිබුණි. | සභාවේ සේවකයන්ගෙන් හිඟ ණය ශේෂ අයකරගත යුතුවේ. | ණය ශේෂ අයකර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත විස්තර දන්වා යවා ඇත. |

3.4 <u>වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම</u>

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කල යුතුවේ. | ඉදිරියේදි පිළියෙල කිරිමට කටයුතු කරමි. |

4. <u>ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය</u>

4.1 <u>විගණන හා කළමනාකරණ කමිටු</u>

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2009 ජූනි 9 දිනැති අංක ඩීඑම්ජ්/2009(01) දරන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ පිළිබඳ චක්‍රලේඛය අනුව කාර්තුවකට වරක් විගණන හා කළමනාකරණ කමිටු රුස්වීම් පැවැත්විය යුතු වුවද,සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු 02 ක් පමණක් පවත්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කල යුතුවේ. | ඉදිරියේදි නියමිත පරිදි කමිටු පැවැත්වීමට කටයුතු කරමි. |